**සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය - 2019**

**--------------------------------------------------------------**

## 1.1 මතය ව්‍යාවනය

**-------------------**

සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරියේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මම මතයක් ප්‍රකාශ නොකරමි. මතය ව්‍යාවනය සඳහා පදනම කොටසේ සාකච්ඡා කර ඇති කරුණුවල වැදගත්කම හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

## 1.2 මතය ව්‍යාවනය සඳහා පදනම

**-----------------------------------**

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය වියාවනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්

----------------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අධිකාරිය අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අධිකාරිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අධිකාරියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අධිකාරියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය හා සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අධිකාරියේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම**

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව පවත්වනු ලබන විගණනය මත පදනම්ව අධිකාරියේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ වගකීම වේ. කෙසේ වුවද, මතය වියාචනය සඳහා පදනම කොටසේ විස්තර කර ඇති කරුණු හේතුවෙන් මෙම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් විගණන මතයක් සඳහා පදනමක් සැපයීමට ප්‍රමාණවත් හා උචිත විගණන සාක්ෂි ලබා ගැනීමට මා හට නොහැකි විය.

**1.5 මූල්‍ය ප්‍රකාශන**

**1.5.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූල නොවීම**

| අදාළ ප්‍රමිතියට යොමුව සහිතව අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 03 හි 12 ඡේදය ප්‍රකාරව ගණුදෙනුවක් හෝ සිදුවීමක් හෝ තත්ත්වයක් කෙරෙහි නිශ්චිත ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම් ප්‍රමිතියක් නොමැති විට කළමනාකරණය විසින් ගිණුම්කරණ ප්‍රතිපත්තියක් නිර්මාණය කර භාවිතා කළ යුතු වුවත් අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල දැක්වෙන රු.1.,486, 109ක් වූ බොල්ණය වෙන් කිරීමට පදනම් කරගත් නිශ්චිත ගිණුම්කරණ ප්‍රතිපත්තිය මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කළ යුතු වීම. |
| (ආ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 07 හි 65 ඡේදය ප්‍රකාරව ජංගම නොවන වත්කම් සඳහා ඵලදායී ජීව කාලය වාර්ෂිකව සමාලෝචනය නොකිරීම හේතුවෙන් පිරිවැය රු.491,623,034 ක් වූ ස්ථාවර වත්කම් සම්පූර්ණයෙන් ක්ෂය කර තිබුණද තවදුරටත් ප්‍රයෝජනයට ගනිමින් පැවතුණි. ඒ අනුව ඇස්තමේන්තු ගත දෝෂය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 03 ප්‍රකාරව ප්‍රතිශෝධනය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති අනුව සම්පූර්ණයෙන් ක්ෂය කර ඇති නමුත් දැනටමත් භාවිතාකරණ වත්කම් ප්‍රත්‍යාගණනය කිරීමට කටයුතු කළ යුතුවීම. |
| (ඇ) ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති 9 හි 15 ඡේදය ප්‍රකාරව තොගය, පිරිවැය හෝ ශුද්ධ උපලබ්ධි අගය යන දෙකින් වඩා අඩු අගයට අගය කර මූල්‍ය ප්‍රකාශනවල දැක්විය යුතු වුවත් අධිකාරිය විසින් තොගවල ශුද්ධ උපලබ්ධි අගය තක්සේරු කිරීමකින් තොරව 2019දෙසැම්බර් 31දිනට තොගවල අගය එහි පිරිවැය වූ රු.13,125,629 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති ප්‍රකාරව තොගවල අගය ඉදිරිපත් කළයුතු වීම. |

## 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| (අ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල බාහිර ක්‍රීඩාංගනයේ (Outdoor Stadium) ගොඩනැගිලි සඳහා ක්ෂය රු.5,247,741 කින් වැඩියෙන් දක්වා තිබීම නිසා සමාලෝචිත වර්ෂයේ ඌනතාවය එම ප්‍රමාණයෙන් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දැක්විණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් වලට ඇති ක්ෂය තැන්පතු වටිනාකම නිවැරදිව ගිණුම්ගත කළ යුතු වීම. |
| (ආ) 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය ප්‍රකාශන අනුව ලැබිය යුතු ස්ථාවර තැන්පතු පොලිය රු.8,427,228 ක් වුවද ලැබිය යුතු නිවැරදි ස්ථාවර තැන්පතු පොලිය රු.3,087,082 ක් වූයෙන් ස්ථාවර තැන්පතු පොලිය රු.5,340,146 කින් වැඩියෙන් දක්වා තිබුණි. මෙම නිසා මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ජංගම වත්කම් එම වටිනාකමින් වැඩියෙන් දැක්වුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර තැන්පතු සඳහා පොලිය නිවැරදිව දැන්වීමට කටයුතු කළ යුතු වීම. |
| (ඇ) ජංගම නොවන වත්කම් අත්පත් කර ගැනීම වෙනුවෙන් 2002 වර්ෂයේ සිට 2019 වර්ෂය දක්වා වර්ෂ 17 ක් තුළ අධිකාරිය වෙත ලැබී තිබුණු රු.2,428,973,065 ක් සහ ලැබී තිබුණු වර්ෂයන් දක්වා නොමැති රු. 4,683,439,544 ක ප්‍රදානයන් 13 ක් සඳහා ක්‍රමක්ෂය කිරීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ස්ථාවර වත්කම් සඳහා ක්‍රමක්ෂය නිවැරදිව ගණනය කර ගිණුම් ගත කළ යුතු වීම. |
| (ඈ) ජාතිය ගොඩනැගීමේ බදු ආදායම හා වියදම හිලව්කර දැක්වීම හේතුවෙන් අධිකාරියේ මූල්‍ය ප්‍රකාශනවල ආදායම් හා වියදම් රු 2,620,533 කින් අඩුවෙන් දක්වා තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | වර්ෂයේ ආදායම් හා වියදම් නිවැරදිව දැන්වීමට කටයුතු කළ යුතු වීම. |

### 1.5.3 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විෂයය | මූලා ප්‍රකාශන අනුව වටිනාකම රු. | අනුරූපී වාර්තා අනුව වටිනාකම රු. | වෙනස රු. | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|---|
| ණයගැතියන්ගෙන් අයවිය යුතු ශේෂ | 10,177,372 | 4,332,943 | 5,844,429 | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | නොසැසඳුණු ශේෂයන් හඳුනාගෙන නිවැරදිව ගිණුම්වල ගැලපීම් කළ යුතු වීම. |

### 1.5.4 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ගිණුම් විෂයයන් 14 කට අදාළ මුළු එකතුව රු.මිලියන 7,369 ක් වූ වත්කම් හා වගකීම් සඳහා වන උපයෝගී ලියවිලි, ශේෂ සනාථ කිරීම් යනාදි සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකිරීම හේතුවෙන් එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට නොහැකි විය. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ශේෂ සනාථ කිරීමට ප්‍රමාණවත් හා ප්‍රවීණ විගණන සාක්ෂි ඉදිරිපත් කළ යුතු වීම. |

### 1.6 ලැබිය යුතු සහ ගෙවිය යුතු ගිණුම්

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) වර්ෂ 01 සිට 12 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන වටිනාකම රු.14,350,656 ක් වූ වෙළඳ ලැබිය යුතු ශේෂ අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අයවිය යුතු මුදල් අප්‍රමාදව අයකර ගැනීම සඳහා විධිමත් ක්‍රියාමාර්ග ගත යුතු වීම. |
| (ආ) අධිකාරිය සතුව සේවා ගිවිසුම් නොමැති වීම හේතුවෙන් අයකර ගත නොහැකි වූ වර්ෂ 10 කට වඩා පැරණි රු.6,288,763 ක් වූ වෙළඳ ලැබිය ශේෂ සමාලෝචිත වර්ෂයේදී භාණ්ඩාගාර අනුමැතිය ලබා ගැනීමකින් තොරව කපාහැර තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | ලැබිය යුතු ශේෂ කපා හැරීම සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමටකටයුතු කල යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | වර්ෂ 02 ක කාලපරිච්ඡේදයක සිට පැවත එන ගිණුම් 04 කට අදාළ වටිනාකම රු.11,704,699 ක් වූ ප්‍රාග්ධන අත්තිකාරම්, වර්ෂ 04 කට වැඩි කාලයක සිට පවතින රු. 17,783,204 ක් වූ රඳවාගත් මුදල්, වර්ෂ 03 සිට 06 දක්වා කාලපරිච්ඡේදයක සිට පැවත එන රු. 4,010,921 ක් වූ වෙනත් ගෙවිය යුතු ගිණුම් නියමිත පරිදි පියවීමට හෝ වගකීමක් නොමැති ශේෂයන් පොත්වලින් ලියා හැරීමට හෝ කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | දීර්ඝ කාලයක සිට පැවත එන ගෙවිය යුතු ශේෂ නිරවුල් කිරීමට කටයුතු කළ යුතු වීම. |

## 1.7 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) 1999 අංක 17 දරන සුගතදාස ජාතික ක්‍රීඩා සංකීර්ණ අධිකාරිය පනතේ 13 වගන්තිය | කළමනාකරණ මණ්ඩලය යටත් පිරිසෙයින් මාසයකට එක් වරක්වත් රැස්විය යුතු වුවත්, සමාලෝචිත වර්ෂයේදී කළමනාකාරිත්ව මණ්ඩල රැස්වීම් 06 ක් පමණක් පවත්වා තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | පනතේ විධිවිධාන අනුව කටයුතු කළ යුතු වීම. |
| **(ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය**<br><br>(i) මුදල් රෙගුලාසි 109 (1) | මීටර් 400 (Synthetic Athletic Track) ධාවන පථය ඉදිකිරීමට අදාළව 2012 වර්ෂයේ සිට කෙරීගෙන යන වැඩ තුළ ඇතුලත්ව තිබූ රු.13,713,615 ක් 2016 වර්ෂයේදී ගිණුම්වලින් කපා හැර තිබුණද පොතෙන් අස්කිරීමේ නියෝගවල පිටපත් විගණකාධිපති වෙත ඉදිරිපත් කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මුදල් රෙගුලාසිය ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ii) මුදල් රෙගුලාසි 880 හා 891 (1) | අධිකාරියේ මුදල් බාරව කටයුතු කරන නිලධාරීන්ගෙන් ඇප ලබා ගැනීමට කටයුතු කර නොතිබුණු අතර ඇප ලේඛනයක් පවත්වාගෙන ගොස් නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම. |
| (ඇ) 1988 අංක 74 දරන පනතින් සංශෝධනය පරිදි ජාතික රාජ්‍ය සභාවේ අංක 1975 අංක 1 දරන වත්කම් බැරකම් ප්‍රකාශන කිරීමේ පනතේ 1 (c) වගන්තිය | අධිකාරියේ මාණ්ඩලික නිලධාරින්ගෙන් 2018 හා 2019 වර්ෂ සඳහා වත්කම් බැරකම් ප්‍රකාශන ලබා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අදාළ මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම. |
| (ඇ) 2006 අංක 13 දරන ආර්ථික සේවා ගාස්තු පනතේ 2 වන වගන්තියේ 2 වන උප වගන්තියේ (ඉ) ඡේදය | අධිකාරියේ 2019 වර්ෂයේ කාර්තුවක ආර්ථික සේවා ගාස්තු බද්දට යටත් පිරිවැටුම රු මිලියන 12.5 ඉක්මවා තිබුණද රු. 169,044,326 ක් වූ පිරිවැටුමක් සඳහා රු.845,222 ක් වූ ආර්ථික සේවා ගාස්තු බදු ගෙවා නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම. |
| (ඉ) 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදය | අධිකාරියේ වාහන 09 ක් සඳහා 2013 වර්ෂයෙන් පසු චක්‍රලේඛ උපදෙස් ප්‍රකාරව ඉන්ධන පරීක්ෂාවක් සිදු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | චක්‍රලේඛ විධිවිධාන ප්‍රකාරව ක්‍රියා කළ යුතු වීම. |

**2.** **මූල්‍ය සමාලෝචනය**

----------------------

**2.1** **මූල්‍ය ප්‍රතිඵල**

--------------

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 63,533,031 ඌනතාවයක් වූ අතර ඊට අනුරූප ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 80,179,897 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.16,646,866 ක වර්ධනයක් නිරීක්ෂණය විය. මෙම වර්ධනයට මෙහෙයුම් ආදායම රු. 29,081,374 කින් වැඩිවීම හා රාජ්‍ය ප්‍රදාන රු.54,650,000 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

## 2.2 අනුපාත විශ්ලේෂණය

ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේදී ජංගම අනුපාතය 2.42 සිට 0.92 දක්වා අඩු වී තිබුණි. ඒ අනුව අධිකාරියේ කෙටිකාලීන බැරකම් පියවීමේ හැකියාව ඉකුත් වර්ෂයට සාපේක්ෂව පිරිහීමක් වී තිබුණි.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| සමාලෝචිත වර්ෂය අවසාන වනවිට තාක්ෂණික, සැලසුම්, මාධ්‍ය, විදුලි, අභ්‍යන්තර විගණන හා උපදේශන යන අංශවල ජ්‍යෙෂ්ඨ මට්ටමේ පුරප්පාඩු 07 ක් ඇතුළුව මුළු පුරප්පාඩු 58 ක් පැවති අතර එම පුරප්පාඩු පිරවීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. එසේම අධිකාරියේ නව කාර්යය මණ්ඩල තනතුරු සඳහා බඳවා ගැනීමේ ක්‍රියාපටිපාටිය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කරවා ගැනීමට අධිකාරිය අපොහොසත් වී තිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අනුමත කාර්ය මණ්ඩලය බඳවා ගැනීමට අප්‍රමාදව කටයුතු කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 අයවැය පාලනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.2 ඡේදය ප්‍රකාරව ඵලදායි මූල්‍ය පාලනයක් සඳහා එක් එක් මූල්‍ය වර්ෂය ආරම්භ වීමට ප්‍රථම අයවැය ලේඛනයක් පිළියෙල කළ යුතු වුවද අධිකාරිය විසින් සමාලෝචිත වර්ෂය සඳහා අයවැය ලේඛනයක් පිළියෙල කර පාලක මණ්ඩලය මගින් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. එසේම 2014 පෙබරවාරි 14 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 5.1 ඡේදය ප්‍රකාරව, කාලපරිච්ඡේදය තුළ ළඟා කර ගත යුතු අරමුණු හා ඉලක්ක ඇතුළත් කර ක්‍රියාකාරී සැලැස්මක් 2019 වර්ෂය සඳහා පිළියෙල කර පාලක මණ්ඩලය මගින් අනුමත කරවා ගැනීමට කටයුතු කර නොතිබුණි. | ඉදිරියේදි නිවැරදි කිරීමට කටයුතු කරනු ලැබේ. | අයවැය ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කර පාලන කාරකයන් ලෙස යොදා ගත යුතු අතර විචලනයන් පිළිබඳව කාලීනව සැලකිල්ලට ගත යුතු වීම. |